# චතාරික සමයේ සතරවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

ඉසයියස් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ඉසයියස් 65: 17 – 21

**හැඬීමේ ශබ්දයක්වත්, පීඩිත වේදනාවේ ශබ්දයක්වත් තවත් නොඇසෙන්නේය.**

සමිඳාණෝ මෙසේ වදාරණ සේක. "මම අලුත් අහසත් ද අලුත් පොළොවක් ද මවමි. පසුගිය දේ මතක් කරන්නේ වත් සිහිකරනු ලබන්නේ වත් නැත. මා මවන දේ ගැන සදහට ම ප්‍රීති සන්තෝෂ වන්න. මා මවන අලුත් ජෙරුසලම ප්‍රීතියෙන් පූර්ණ වන්නේය. එහි වැසියෝ සොම්නසින් වෙසෙති. මම ජෙරුසලම කෙරෙහිත් මාගේ සෙනග කෙරෙහිත් ප්‍රසන්න වෙමි. ඇඬීමේ ශබ්දයක් වත් පීඩිත වේදනාවේ ශබ්දයක් වත් එහි තවත් නොඇසෙන්නේය. ස්වල්ප දවසකින් මැරෙන බිළින්දෝ තවත් එහි නොවෙති. පූර්ණ ආයු නොවළඳා මැරෙන මහල්ලෝ නොසිටිති. සිය වසක් ජීවත් වන්නා 'තරුණයෙකැ'යි ගණන් ගනු ලැබේ. ඒ වයසට පෙර නැසී යන්නා 'ශාප ලද්දෙකැ'යි ගණන් ගනු ලැබේ. ඔව්හු ගෙවල් ගොඩනඟාගෙන එහි වාසය කරන්නෝ ය. මිදි වතු වවාගෙන එහි පලදාව කන්නෝය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය **30: 1, 3-5, 10-12**

පිළිතුර: මාගේ සමිඳුනි, ඔබ මට සුව සෙත සැලසූ නිසා ඔබට තුති පුදමි.

ගීය:

ඔබ මා උසස් කළ බැවින් ද මාගේ දුක් ගැන මා සතුරන්ට ප්‍රීති වීමට නුදුන් බැවින් ද සමිඳුනි, ඔබට ප්‍රශස්ති ගී ගයමි.
සමිඳුනි, ඔබ පාතාලයෙන් මා ගොඩගත් සේක. මා වළපල්ලට නොයන පරිදි ඔබ මා දිවි රැකගත් සේක.

පින්වතුනි, සමිඳුන්ට ගී පසස් නගන්න. ඒ නිර්මල නාමයට තුති ගී ගයන්න. මන්ද එතුමන්ගේ උදහස ඇසිල්ලකට පමණ ය. එතුමන්ගේ කරුණාව දිවි ඇති තාක් ය. රැයේ හැඬීම පවතියි. උදය ප්‍රීතිය උදා වෙයි.

සමිඳුනි, සවන් දීමට මට කරුණා කළ මැනව. සමිඳුනි, ඔබ මාගේ සරණ වුව මැනව. ඔබ මාගේ දොම්නස සොම්නසට හැර වූ සේක. ඔබ මාගේ ගෝනි රෙදි මුදා තුටු පිළියෙන් මා සැරසූ සේක.
දැන් ඉතින් මම නිහඬව නොසිටිමි. ඔබට ගී පසස් ගයන්නෙමි. මාගේ දෙවි සමිඳුනි, සදහටම ඔබ හට ගී ගයන්නෙමි.

## සාධුකාරය

"මුළු සිතින් දැන්වත් දෙව් සමිඳුන් වෙත හැරී එන්න. මන්ද, ස්වාමින් වහන්සේ කරුණාභරිත ය. දයාන්විත ය."

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 4 : 43–54

### *"යන්න, ඔබේ දරුවා ජීවත්ව සිටී."*

සමාරියේ දෙදවසක් නැවතී සිටි ජේසුස් වහන්සේ, එතැනින් නික්ම ගලීලයට වැඩම කළ සේක. මන්ද, "ගමේ දිවැසිවරයා ගමට අගේ නැතැ"යි කීවේ උන්වහන්සේම ය. එහෙත් ජෙරුසලමෙහි මංගල්‍යයේ දී උන් වහන්සේ කළ සියල්ල දුටු බැවින් ගලීලයෝ උන් වහන්සේ උත්සවාකාරයෙන් හොඳින් පිළිගත්හ.

යළිත් උන් වහන්සේ ගලීලයේ කානා නම් ගමට වැඩම කළ සේක. උන් වහන්සේ විසින් වතුර මිදියුස බවට හරවන ලද්දේ එහිදී ය. එකල එහි එක්තරා රාජ්‍ය නිලධාරියෙක් විය. ඔහුගේ පුත්‍රයා රෝගාතුර ව කපර්ණාවුමෙහි සිටියේ ය. ජේසුස් වහන්සේ ජුදයේ සිට ගලීලයට වැඩම කළ බව අසා, ඔහු උන් වහන්සේ වෙත ගොස් තම පුත්‍රයා මරණාසන්නව සිටින බැවින් අවුත් ඔහු සුව කරන මෙන් උන් වහන්සේගෙන් අයැද සිටියේය. ජේසුස් වහන්සේ "ඔබ ලකුණු ද අරුම පුදුම දේ ද දුටුවොත් මිස විශ්වාස නොකරන්නහු ය"යි ඔහුට වදාළ සේක. රාජ්‍ය නිලධාරියා ද

“මහතාණෙනි, මාගේ දරුවා මිය යන්නට පෙර වැඩිය මැනැවැ”යි ඇයැදීය. ජේසුස් වහන්සේ කතා කරමින් “යන්න, ඔබේ පුත්‍රයා ජීවත් වන්නේ ය”යි ඔහුට වදාළ සේක. ඒ තැනැත්තා ජේසුස් වහන්සේ වදාළ වචනය විශ්වාස කරනගෙන ගියේය. ඔහු යන කල ඔහුගේ දාසයෝ පෙරමගට අවුත් “ඔබේ පුත්‍රයා ජීවත් වන්නේ ය”යි කීහ. පුත්‍රයා සුවය ලබන්නට පටන් ගත්තේ කොයි වේලාවේ දැයි ඔහු ඔවුන්ගෙන් විමසීය. “ඊයේ පස්වරු එකට පමණ උණ බැස්සේය”යි ඔව්හු කීහ. “ඔබේ පුත්‍රයා ජීවත් වන්නේ යැ”යි ජේසුස් වහන්සේ ඔහුට වදාළේ ඒ මොහොතේ දී යයි දැනගත් බැවින් ඔහු ද ඔහුගේ ගෙයි වැසි සියල්ලෝ ද එතුමන් අදහා ගත්හ. මේ වනාහි ජේසුස් වහන්සේ ජුදයේ සිට ගලීලයට පැමිණි පසු කළ දෙවන දේව බල ප්‍රකාශනය වේ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.